2015පෙබරවාරි මුල් සතියේ සිංහල සංස්කෘතිය පිළිබඳ ඓතිහාසික සිද්ධියක් විහාර මහා දේවි උද්‍යානයට නුදුරු තැනෙක දක්නට ලැබිණ.

මහනුවර මගුල් මඩුව සහ පත්තිරිප්පුව නිර්මාණය කළ ශ්‍රේෂ්ඨ ශිල්පියා වූ මූලාචාරි නමැත්තා නුවර වැවේ ගිල්වා මරා දැමීම ඔහුගේ අගය දත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේම වැඩක් බව ජනප්‍රවාදයේ එයි. එසේ කළා නම් ඒ ක්‍රියාව පුද්ගලයකුගේ අගය දැන ගෙන කරන ලද්දකි. අපරදිගට සිංහල කලා ශිල්ප පමණක් නොව බුදු දහම හා සිංහල සංස-"කෘතිය හඳුන්වා දීමෙහි ලා උපරිම මෙහෙයක් ඉටු කළ විද්‍යාඥයකු හා ප්‍රාඥයකු වශයෙන් යටත් පිරි-සෙයින් අපරදිගුවන්වත් පිළිගන්නා ශ්‍රී ලාංකිකයකු වූ ආචාර්ය ආනන්ද කෙන්ටිෂ් කුමාරස්වාමි නෙළුම් පොකුණ නම් වූ වගුරක ගිල්වා දමන ලද්දේ අර වාගේ දන්නා කමට නොව නොදන්නා කමටය.




රජ වාසල සිටි වන්දි භට්ටයන් කිසිවෙක් ඒ ප්‍රාඥයාගේ අගය නොදත්තෝය. අගය දත් දෙ-දෙනෙක් පමණක් කරුණු කියා සිටියහ. ආචාර්ය වෝල්ටර් මාරසිංහ සහ වික්ටර් අයිවන් යන දෙ-දෙනා. ඒ හඬ මාළිගාවට ඇසී නැත.

ශ්‍රී ලංකාවේ සිටි ලාබාලම උපාධිධරයා වශයෙන් බොහෝ දෙනා සළකන්නේ මහාචාර්ය ගුණපාල මලලසේකර ය. එහෙත් 12 වැනි වියේදී ලන්ඩන් සරසවියෙන් විද්‍යා උපාධියක් ලැබූ ශ්‍රී ලාංකිකයා ආනන්ද කුමාරස්වාමි බව කිව යුතු ය. ඒ තරුණයා ලන්ඩන් නුවර ප්‍රභූ සමාජයේ විශේෂ පිළිගැනීමක් ලැබීමට සමත් වූ මුතු කුමාරස්වාමි ගේ පුත්‍රයාය. මුතු කුමාරස්වාමි පසුව බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ධුරයට පත් වූ ඩිස්රායෙලි ගේ නවකතාවක ප්‍රධාන චරිතයට වස්තුව වූ චරිතයක් බව ඩී බී ධනපාල සඳහන් කරයි. නීතිඥයකු වශයෙන් සිය රට බලා පැමිණි මුතු කුමාරස්වාමි ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සාමාජිකයකු ලෙසින්ද ක්‍රියා කිරීමෙන් පසු නයිට් තත්වයක් ලැබූ ප්‍රථම ශ්‍රී ලාංකික දෙමළ ජාතිකයා විය යුතුය.

මුතු කුමාරස්වාමි නිසා ඉංගිරිසි ජාතික මවකගේ කුසින් උපන් ආනන්ද පියා මෙන් දේශපාලනය හෝ අපරදිගුන්ගේ ගරු නම්බු සොයා ගියේ නැත . අපරදිගුන්ට ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාව ඇතුළු පෙරදිග රටවල සංස්කෘතිය හා කලාව හඳුන්වා දෙමින් අපරදිගුවන් අනුගමනය කළ ශ්‍රී ලාංකිකයන්ට තමන් සතු සංස්කෘතික උරුමය ගැන කියා දීමටද ඉදිරිපත් විය.



# කුමාරස්වාමි ගොඩ ගැනීම

1877 අගෝස්තු 22 වැනි දින කොළඹ දී උපත ලත් ආනන්ද කුමාරස්වාමි උපාධි ලාභයෙන් පසු මව් රටට අවුත් 1902 - 1906 දක්වා ලංකාවේ ඛණිජ සම්පත් පිළිබඳ පර්යේෂණයක නිරත විය. ඔහුට ලන්ඩන් සරසවියෙන් ආචාර්ය උපාධිය පිරිනමන ලද්දේ ඒ පර්යේෂණයේ අගය සළකා බැලීමෙන් පසුවය. ඔහුගේ පර්යේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් පිහිටුවන ලද ලංකා භූ විද්‍යා පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ආරම්භක අධ්‍යක්ෂ වූයේද ඔහු ය.

1905 දී ඔහු විසින් සම්පාදනය කරන ලද "මධ්‍යතන සිංහල කලා" ශිල්ප සිංහලට පරිවර්තනය කරන ලද බව දනිමි. එය හුදු සිංහල කලා ශිල්ප ගැන කියන විස්තර ඇතුලත් නාමාවලියක් නොව සිංහලයාගේ ගති පැවතුම් ආකල්ප හා මිථ්‍යා මත ද විමර්ශනයට භාජන කරන ශාස්ත්‍රීය ග්‍රන්ථයක් විය. අපේ සංස්කෘතිය හා අතීතය ගැන උදම් අනන බොහෝ දෙනාට නොපෙනුන සැඟවුණ ලක්ෂණ දැකීමට එංගලන්තයේ ඇති දැඩි වුණ ආ-නන්ද කුමාරස්වාමි සමත් වූ බවට අගනා නිදසුනක් යට කී "මධ්‍යතන සිංහල කලා ශිල්ප" නම් ග්‍රන්ථයෙන් උපුටා දක්වමි.

"මගේ අදහස වනුයේ සිංහල ජනතාව 18 වැනි සියවසේ ගත කළාට වඩා හොඳ දිවියක් අද ගත නොකරන බව ය. ප්‍රගතිය ගැන කතා කිරීමත් යථාර්ථයත් දෙකම එකක් නොවේ. ශිෂ්ටාචාරය වශයෙන් හඳුන්වනු ලබන්නේ නව ආශාවන් - අවශ්‍යතාවන් නිර්මාණය කරන අතර, ඒවා සපුරා ගනු වස් පුද්ගලයා තමාගේ තත්වය දියුණු කර ගැනිමය. ඇත්ත වශයෙන් ප්‍රගතියේ ලක්ෂණය වශයෙන් ගත හැක්කේ අශාවන්ගේ සංඛ්‍යාව නොව ගුණාත්මක භාවයයි. ජීවන කලාව පිළිබඳ ප්‍රගතිය මැනිය හැක්කේ ඒ අනුවය. සිංහලයාගේ රුචිය පිළිබඳ අවබෝධයක් ඇති කිසිවකු ඔහුගේ ඒ ආශා ගුණාත්මක වශයෙන් දියුණු වී ඇති බවක් නොකියනු ඇත."

අද දවසේ අපේ සංස්කෘතිය විග්‍රහ කරන විද්වතුන්ගේ අවධානයට හා අධ්‍යයනයට භාජන විය යුතු උපදෙසක් ලෙසින් ඒ ප්‍රකාශය දක්වනු කැමැත්තෙමි. මුල් අවධියේ ඔහු විසින් සඟරා වලට ලියන ලද ලිපි මගින් ප්‍රකට වූයේ විදේශයක ආභාෂය ලැබූ උගතකු සතු ආකල්ප නොව සය මව් බිමේ අතීතය හා සාර ධර්ම අවබෝධ කරගත් බුද්ධිමතකුගේ පරිනත ලක්ෂණ ය. "උඩරට නායකයන්ට විවෘත ලිපියක්" හා "පෙරදිග ඉංගිරිසිකරණය" යන ලිපි දෙක නිදසුන් ය.

**ශ්‍රී ලංකාවේ සිටි ලාබාලම උපාධිධරයා වශයෙන් බොහෝ දෙනා සළකන්නේ මහාචාර්ය ගුණපාල මලලසේකර ය. එහෙත් 12 වැනි වියේදී ලන්ඩන් සර-සවියෙන් විද්‍යා උපාධියක් ලැබූ ශ්‍රී ලාංකිකයා ආනන්ද කුමාරස්වාමි බව කිව යුතු ය.**

1906 දී ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය පිහි-ටුවීමට මුල් වූ ඔහු එහි ආරම්භක සභාපති ද වූයේය. ඉංගිරිසිකරණයට ගොදුරුවූවන්ගේ රැවුම් ගෙරවුම් මධ්‍යයේ ඔහු ජාතික අධ්‍යාපන පද්ධතියක් ඇති කිරීම සඳහා ව්‍යාපාරයක් දියුත් කිරීමට ඉදිරිපත්වූයේ ඩබ්ලිව් ඒ ද සිල්වා සර් පොන්නම්බලම් අරුනාචලම් හා එෆ් එල් වුඩ්වර්ඩ් බඳු නායකයන් සමග එක්වී-මෙනි. ඒ සංගමය විසින් අවධාරණය කරන ලද්දේ සියලුම පාසල් වල සිංහල හා දෙමළ භාෂා වලට අමතරව ජාතික සංස්කෘතිය ඉතිහාසය හා කලාව ඉගැන්විය යුතු බව ය. එදා පටන් මේ ව්‍යාපාරයේ අගය වටහා ගැනීමට නායකයන්ට වසර පනහක් පමණ ගතවිය.

ආනන්ද කුමාරස්වාමි ලියූ ලිපි සංඛ්‍යාව 450 ඉක්මවා යන්නේය. ඒ හැම ලිපියක්ම අපරදිග විද්වතුන්ගේ ගෞරවයට පාත්‍ර වූ ශාස්ත්‍රීය නිර්මාණ විය. ශිවලේ නර්තනය නම් වූ ඔහුගේ ග්‍රන්ථයේ එක් පරිච්ඡේදයක් ඇසුරු කොට ගෙන සුප්‍රකට ඉන්දියානු ලේඛක මුල්ක් රාජ් ආනන්ද් පොතක්ම ලියූ බව සඳහන් කිරීම කුමාරස්වාමිගේ පාණ්ඩිත්‍යය ප්‍රකට කරන අගනා සාධකයකි.

කුමාරස්වාමි ලියූ ග්‍රන්ථ අතර පහත දැක්වෙන නිර්මාණ විශේෂ අගයකින් යුතුය.

බුදුන් සහ බුදු දහමින් දෙන පණිවුඩය
බෞද්ධ කලාව
ගෞතම බුදුන්ගේ ජීවමාන චින්තනය
ඉන්දියානු සංගීතය
 හිවගේ නර්තනය
පෙරදිග හා අපරදිග
හින්දු ආගම හා බුදු දහම
ඉන්දියානු කලාවට ප්‍රවේශයක්
ශිෂ්ටාචාරය යනු කුමක්ද?
කාලය සහ අනන්තය
ඉන්දියානු හා ඉන්දුනීසියානු චිත්‍ර ඉතිහාසය
කලාවේ දක්නට ලැබෙන ස්වභාවධර්මයේ පරිවර්තනය
ප්‍රඥාවේ ප්‍රභවය
ක්‍රිස්තියානි හා පෙරදිග කලාව පිළිබඳ දර්ශනය
යක්ෂයෝ
ඉන්දියානු ගෘහ නිර්මාණ මූර්ති හා චිත්‍ර කලා ශිල්ප

ආනන්ද කුමාරස්වාමි සහ ඔහුගේ පොත පත ගැන ලියූ එකම ශ්‍රී ලාකිකයා ඩී බී ධනපාල යයි සිතමි. ඔහුගේ "පදබට එයදිැ ජර්ැබඑ යන ග්‍රන්ථයේ එන ප්‍රධාන චරිතයක් වනුයේ මේ මහා ප්‍රාඥයාය. ධනපාල සිය ලිපිය අවසන් කරන වදන් ආනන්ද කුමාරස්වාමි ට පිරිනැමිය හැකි උසස්ම උපහාරය බව කිව යුතුය. මේ ඒ වදන් ය.

"ඔහු විසින් අප ගෙන එන ලද්දේ අන්ධභාවයෙන් ආලෝකයටය. දුගී භාවයෙන් ධනවත් තත්වයටය. අන්ධකාරයෙන් සූර්යාලෝකයටය."

අනගාරික ධර්මපාලතුමා රට හැර ගියේ ලේක්හවුස් පත්තරවලින් දිගටම දෙන ලද පහර නිසා කළකිරී-මෙන් යයි කියනු ලැබේ. ඩී බී ධනපාල කියන විදියට ආනන්ද කුමාරස්වාමි විදේශගතවීමට ද එබඳු ම පසුබිමක් තිබී ඇත .

බොස්ටන් නුවර ලලිත කලා කෞතුකාගාරයේ ඉන්දියානු අංශය බාරව සිය රාජකාරි ජීවිතයේ අවසන් අවදිය ගත කළ ආනන්ද කුමාරස්වාමි 1947 සැප්තැම්බර් 9 වැනි දින මැසචුසෙට් ප්‍රාන්තයේ හීඩ්හැම් නුවරදී අභාවප්‍රාප්ත විය.

සන්නස Cartoon by PK




**VCE Chemistry 2014**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage**
0407664546